# 'පට්ඨාන' ධර්ම දේශනා මාලාවේ
# 07.06.2018 දින පැවැත්වූ දේශනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදුපියාණන්වහන්සේට අනන්ත කාලයක් සංසාරේ දානාදී දස පාරමී ධර්මයන් සම්පාදනය කරමින් සත්වයන් කෙරෙහි පතලා වූ මහත් වූ කරුණාවකින් ගුණ පුරාගෙන සම්බුද්ධත්වය වෙත වැඩම කළාවූ සියලුම කෙලෙස් ධර්මයන් ප්‍රතිහානය කරගෙන ලොව්තුරා බුද්ධත්වයට පත් වී වදාළා වූ අනන්ත අපරිමාණ ගුණයන්ගෙන් පිරිපුන් සම්මා සම්බුදුපියාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා! ඒ ශාන්ති නායක සම්මා සම්බුදුපියාණන්වහන්සේ විසින් දැක වදාළා වූ අවබෝධකොට ගත්තා වූ දේශනා කොට වදාළා වූ ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් ධර්ම මාර්ගයේ ගමන්කොට ආර්ය ධර්මයන්ට පත් වී වදාළාවූ ගුණයන්ගෙන් පරිපූර්ණ සන්තාන ඇත්තා වූ අශ්ඨාර්ය පුග්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරමි, මාගේ නමස්කාරය වේවා! බුද්ධ රත්නයේ ධර්මය ධර්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ ගුණානුභාව බලයෙන් ඒවාගේම තුනුරුවන්ගුණ සිහිපත්කොට වන්දනාකර ගැනීමේ උතුම් කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අපේ මේ අසාගෙන සිටින්නාවූ පින්වතුන් මේ මොහෙත දක්වා වැඩුවා වූ දාන සීල භාවනා ආදී උත්තරීතර පුණ්‍ය ධර්මයන්ගේ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ දහම් වැඩ සටහන තුලින් ඉස්මතු කරලා සාකච්ඡා මාර්ගයෙන් කියලා දෙන්නාවූ ධර්ම කරුණු සැමදෙනාටම ඉතාමත්ම හොඳින් අවබෝධ වේවා! වැටහේවා! තේරුම් ගන්න ලැබේවා! ඒ සඳහා කිසිම මාර බාධක ධර්මයක් ඉදිරිපත් නොවේවා! බාහිර වශයෙනුත් ආධ්‍යාත්මික වශයෙනුත් කිසිම බාධකයක් නීවරණ ධර්මයක් ඉදිරිපත් වෙන්නේ නැතුව සතිසම්පජඤ්ඤයෙන් යුක්තව සමාධිගත හිතකින් යුක්තව මනසිකාරය පවත්වමින් ප්‍රඥාව අවධිකරගෙන එක එකක් පාසාම ධර්ම කරුණු හොඳින් වටහා ගන්න තේරුම් ගන්න අවබෝධ කරගන්න හේතු ඵල ධර්මයන්ගේ යථා ස්වභාවය දැන ගන්න සැමදෙනාටම ශක්තිය ලැබේවා! මෙය

උතුම් නිර්වාණ මාර්ගයක්, නිර්වාණ මාර්ගයේ ගමන් කරන ප්‍රතිපදාවක්, නිවන් මගක් වේවා! කෙළවර සැම දෙනාටම නිවන් සුව අත්පත් වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ආශීර්වාද කරනවා.

දැන් අපි මේ වෙලාවේදී ගිය සතියේ ඉදිරිපත් කරගත්තාවූ ධර්ම කරුණු වල ඉදිරියට යන කොටසක් මේ කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. අපි ඉස්සර වෙලා සුවිසි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව කථා කළා. ඊළඟට ප්‍රත්‍යය ධර්ම විස්තරයක් අරගෙන දැන් මේ යන්නේ ප්‍රත්‍යය ධර්මයන්ගේ වීථික්‍රමය. ඒ කියන්නේ විසර්ජනා වාරය. පටලවාගන්න හොඳ නෑ. චිත්ත වීථි ක්‍රමයයි මේ විසර්ජනා වාර වීථි ක්‍රමයයි කියන්නේ දෙකක්. මේ දවස්වල අපි කථා කරන්නේ අධිපති ප්‍රත්‍යය යටතේ තිබෙන විසර්ජනා වාර 10. ඒ කියන්නේ වීථි ක්‍රම 10 ක් තිබෙනවා. ඒ 10 සම්බන්ධයෙන් තමයි අපි මේ වෙලාවේ මේ කාලේ අරගෙන කියලා දෙන්නේ. ඒකෙ අපි දැන් වීථි වාර 4 ක් විතර කිව්වා කියලා. කුසල ධර්මයන්ට අදාළ කොටස කියලා දුන්නා. අද අපි අකුසල ධර්ම වීථිය ඉදිරිපත් කර ගනිමු. අපේ පින්වතුන්ට මේ කාරණය මතක ඇති. මේ කථා කරන ධර්ම මොනවාද කියලා හිතාගන්න පුළුවන් මෙන්න මේ විදියට. හරිම සියුම් ධර්ම කණ්ඩයක් ගැන මේ කථා කරන්නේ. මේ පට්ඨාන ධර්මය ඉතාම සුක්ෂම ධර්මවලට ගැබ් වී තිබෙන තවත් ධර්ම ස්වරූපයක්. ධර්ම වල ගැබ්වී තිබෙන තවත් ධර්ම ස්වරූපයක් ගැන ඉතා සියුම්ව කෙරෙන්නා වූ විග්‍රහයක් තමයි මේ පට්ඨාන ධර්ම පිළිබඳව කියවෙන්නේ.

දැන් අපි හිතමු යකඩ කබලක් රත්වෙලා තිබෙනවා නම් ඒක රතුපාට හැටියට තිබෙනවා. ඒක අපිට පේනවා. ඒ රත් වෙච්ච යකඩ කබලේ අපි ෆොටෝ එකක් ගැහුවොත් රත්වෙච්ච කබල වදිනවා. රතුපාටට කබලේ හැඩෙත් වදිනවා. ඒක අපිට අමාරු නෑ. ඒක යම්කිසි වස්තුවක්. බලා ගන්න පුළුවන්. හැබැයි ඊටත් වඩා සියුම් දෙයක් ඒ රත්වෙච්ච කබලෙන් නිකුත් වෙනවා. අපිට එක පාරම ඇහෙන් රූප සටහනක් හැටියට අල්ලා ගන්න බැරි හරියට මිරිඟුව වගේ රස්නේ ගතියක් ඒකෙන් නිකුත් වෙනවා. සමහර වෙලාවට ඒ රත්වීමේ හැටියට ඒක අඟල් හතක් අටක් දහයක් දොළහක් වගේ එහෙම නැත්නම් අඟල් හතරක් පහක් වගේ ප්‍රමාණයකට, ඒක ගිනි දැල්ලකුත් නොවී නමුත් එහෙම විහිදෙන ගතියක් තිබෙනවා. එතකොට රත්වෙච්ච කබලයි ඒකෙන් නිකුත් වෙන්නා වූ ඒ

ස්වභාවයයි කියන්නේ දෙකක්. ඒ වගේ යම් කිසි ධර්මයක තිබෙන්නා වූ අමුතු වූ සූක්ෂම ධර්ම ස්වභාව රාශියක් ගැනයි මේ කථා කරන්නේ. මේක මතක තියා ගන්න. අද 5 වෙනි වීථිය පිළිබඳව අපි මේ විදියට කියනවා. ඒකෙ පාලි වීථිය විග්‍රහ වෙන්නේ මේ විදියටයි.

**5. අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති. ආරම්මණාධිපති – රාගං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති. දිට්ඨිං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

මේකේ තේරුම **අකුසලො ධම්මො** = අකුසල ධර්මයක් (මෙතන අකුසල ධර්මයක් කියලා කිව්වහම ලෝභ මූල සිත 8 + ද්වේශ මූල සිත් 2 + මෝහ මූල සිත් 2 = අකුසල සිත් 12 ගැන තමයි මේ කියන්නේ). **අකුසලස්ස ධම්මස්ස** = තවත් අකුසල ධර්මයකට, **අධිපතිපච්චයෙන පච්චයො** = අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. ඒ අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙන්නේ ආකාර දෙහෙකටයි. එකක් ආරම්මණ වශයෙන් අධිපති වෙනවා. අනිත් එක සහජාත වශයෙන් අධිපති වෙනවා. ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් අකුසල ධර්මයන්ට ප්‍රත්‍යය වෙන අකුසල ධර්මයන් තිබෙනවා.

අපි මේ විදියට ඕක තේරුම් ගනිමු. අපි බොහොම ලොකුවට හිතන, ඉස්මතු කරලා අගේ කරලා අරමුණු කරනවා මේ ලෝභ මූල සිත් 12 න් සිත් 8 ක්. ඒවා ටිකක් හොඳට හයියට, ඒවාගේම වටිනවා කියලා, හොඳයි කියලා, ඒවගේ අපි හිතින් ඒක හරියට ගැම්මට ගන්නවා. අපි මේ විදියට ඒ ගැන හිතුවොත් - දැන් අපි කාට හරි බණිනවා. මේක උදාහරණයක්. දොස් කියලා පහත් කරලා නින්දා කරලා, අපහාස කරලා කාටහරි බණිනවා. බැන්නහම තව එක්කෙනෙක් ඇවිල්ලා කියනවා 'බොහොම හොඳයි, ඒ බැනපු එක බොහොම හොඳයි, ඔහොම තමයි කියන්න ඕන' කියලා ඒක අගේ කරනවා. දැන් මේ ඉස්සෙල්ලා බැනපු එක්කෙනාට සිද්ධ උනේ මොකක්ද? ද්වේශ සහගත සිත් පහළ උනා. ඒවා අකුසල ධර්ම. ඒක අතීතයට ගියා. පස්සේ ඒක අගේ කරනවා. ඒ

වෙලාවට පස්සේ සිතුවිලිවලට අරමුණු වෙන්නේ අර ඉසෙල්ලා එක්කෙනාගේ ද්වේශය. ඒක තමයි අගේ කරලා ඒක තමයි ඉහළට තියලා ප්‍රශංසා කිරීමක් කරන්නේ. ඉස්සෙල්ලා කියපු එක්කෙනාගේ කථාවට ලෝභ කිරීමක් අගේ කිරීමක් සිද්ධ වෙන්නේ. පස්සේ එක්කෙනාට තිබෙන්නේ තරහකුත් නොවෙයි, එයා කරන්නේ හරියට අගේ කිරීමක්, ලෝභයක්. එතකොට මේ පස්සේ පහළ වෙන ලෝභ සහගත සිතුවිලි ඉස්සර වෙලා කියපු ඉස්සරවෙලා සිදු වෙච්ච පහළ වෙච්ච අකුසල ධර්මයන් අරමුණු කරගෙන පහළ වෙනවා. එතකොට මේ පස්සේ පහළ වෙන්නා වූ අකුසල ධර්මයන්ට ආරම්මණ වශයෙනුත් අර ඉස්සෙල්ලා පහළ වෙච්ච අකුසල ධර්මය ප්‍රධානයි. ඒ වාගේම ඒ වෙලාවේ පහළ වෙන්නාවූ චිත්ත චෛතසික ධර්ම වලටත් එක්කෙනෙක් සහජාත වශයෙන් ඉදිරිපත් වෙලා වැඩ කරනවා. ආන්න ඒ වගේ මේකෙ ප්‍රත්‍යය ධර්මයන් එකට එකක් එකට එකක් අරමුණු වෙලා සිද්ධ වෙන බව අපි දැන ගන්න ඕන. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො -** අර වේලාවට එනම් යම්කිසි අකුසලයක් අගේ කරන වෙලාවට අනිත් ඔක්කොම අරමුණු ටික නවතිනවා. සහජාත වශයෙන් එන ඔක්කොම නවතිනවා. මේකට හරියට focus වෙනවා.

ඊළඟට **සහජාත** ශක්තියත් අපි තේරුම් ගන්න ඕන. අධිපති ප්‍රත්‍යය යටතේ කරුණු දෙකක් කථා කරනවා. අපේ මේ අළුතෙන් ඉන්නා වූ සහ දිගටම මේකට සම්බන්ධ වෙලා කටයුතු කරන පිංවතුන් තේරුම් ගන්න ගුණ ස්වාභාව දෙකක් කථා කරනවා. අධිපති ප්‍රත්‍යය යටතේ. ‘ආරම්මණ වශයෙන්’ සහ ‘සහජාත වශයෙන්’.

සහජාත වශයෙන් කථා කරනකොට තිබෙනවා ‘ඡන්ද’ ‘චිත්ත’ ‘විරිය’ ‘විමංසා’ කියලා. නමුත් අකුසල ධර්මයන්ගේ කොහෙද තිබෙන්නේ විමංසාවක්. ඒක නිසා අකුසල ධර්මයන්ගේ තිබෙන්නේ ‘ඡන්ද’ ‘විරිය’ ‘චිත්ත’ පමණයි. හැබැයි මේ තුනෙන් එකක් ආවත් එතැනදී ඕක වැඩ කරනවා. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො.**

ඊළඟට තේරුම් ගන්න ඕනෑ ප්‍රත්‍යය මොකක්ද? ප්‍රත්‍යය උප්පන්නය මොකක්ද? කියලා. ප්‍රත්‍යය කියලා කියන්නේ යම් කිසි දේකට හේතුවෙන, යම් කිසි දේකට

උපකාරවෙන ශක්තියක් තිබෙන ධර්මයට. ඉස්සරවෙලා අකුසල ධර්මයක් සිද්ධ උනා ඒක අතීතයට ගිය බව හැබෑව. හැබැයි වර්තමානයෙන් ගිලිහිලා අතීතයට ගියාය කියලා ඒ අතීතයට ගිය දේ නිකම්ම නිකන් ගියා නොවෙයි. ඒක මතක් වෙච්ච ගමන් ඒකට හැකියාවක් තිබෙනවා මේ වෙලාවේ ඒ පැත්තට හරවලා, අතීතය පැත්තට හැරවිච්ච 'සිතුවිලි' 'චෛතසික' 'සිත්' පහළ කරන්න පුළුවන් ශක්තියක්. ඒක නිසා දැන් මේ පහළ වෙන්නා වූ දැන් මේ ඇතිවෙන්නා වූ චිත්ත චෛතසික ටික තමයි ප්‍රත්‍යය උප්පන්නය. ඉස්සරවෙලා පහළ වෙච්ච එක තමයි ප්‍රත්‍යය. ඒක නිසා 'ප්‍රත්‍යයයි' 'ප්‍රත්‍යය උප්පන්නයයි' ඔය විදියට තේරුම ගන්න ඕන.

ඊළඟට අපි මෙහෙම බලමු. ඕකේ විග්‍රහය පාලියෙන් යනවා මෙහෙම. **රාගං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති. -** නියම තැන ඔතන. දැන් අපි මොකක් හරි වරදක් කළොත් මෙතැන වචනය තිබෙන්නේ **රාගය** කියලා. අපි කාපු බීපු දෙයක්, කරපු ලියපු දෙයක්, ගිය තැනක්, බලපු දෙයක්, අපි ඒ අවස්ථාවන්වලදී විඳපු දෙයක්. අපි හිතමු අපි tour එකක් කරා. කොහේ හරි ගියා, ලෝභ සිතුවිලි පහළ කරගත්තා කියලා. බොහොම ප්‍රීති ජනකයි. ඒ සතුටු වෙච්ච දේවල්, හිනහා වෙච්ච හිනහවල් මේවා ඔක්කොම ලෝභ. ඊළඟට කරපු විහුළු තහළු මේවා ඔක්කොම ලෝභ සහගතයි. අකුසල. ඒවගේ පහළ වෙච්ච දේවල්, ඇති වෙච්ච ලෝභ සහගත සිතුවිලි, බලපු කියපු දේවල් ඒවා ඔක්කොම **- රාගං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති -** වෙච්ච දේවල් highlight කරලා කථා කරනවා. හිතනවා මෙනෙහි කරනවා. ඒ වෙනකොට රාගය ගරුකරලා - ලෝභය ගරු කරලා - ඒ ලෝභයට වටිනා කමක් දීලා නැවත ඒකට රාගයක් උපදිනවා කියලා කියන්නේ ලෝභ කමක් ඇති වෙනවා. බැඳීමක් ඇතිවෙනවා. අගේ කිරීමක් ඇතිවෙනවා. අනිත් එක තමයි 'ඒ මගේ' 'ඒ මම කරපු දේ' කියලා පුද්ගල සංඥාව, සත්ව සංඥාව, ඒ වාගේම ආත්ම සංඥාව එතෙන්ට ගලාගෙන එනවා = **දිට්ඨි උප්පජ්ජති**. ඔය විදියට තිබෙනවා එක කාරණයක්.

අනිත් එක තමයි, **දිට්ඨිං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති** = මොකක් හරි දෙයක් දෘෂ්ඨිය කියලා

කියන්නේ අකුසලයක්. මේ කාරණය තේරුම් ගැනීමට අපේ වටපිටාවෙන් ගත්තොත් මේක අපේ වට පිටාවේ ඉන්න අයටත් තිබෙනවා. දෘෂ්ඨිය අකුසලයක් උනාට ඒ දෘෂ්ඨියේ සමහර තැන්, සමහර අවස්ථා තිබෙනවා ප්‍රඥාවන්තයෙකුගේ ප්‍රඥාවේ ස්වරූපය, ආකාරය අරගෙන ඉදිරිපත් වෙනවා. ප්‍රඥාවේ ආකාරය අරගෙන ක්‍රියාත්මක වෙන්න බලනවා. එතකොට සාමාන්‍යයෙන් ධර්මය දන්නේ නැති සිහියක් කල්පනාවක් එතරම් නැති එක්කෙනාට පෙන්නේ ඒක ප්‍රඥාවේ හැඩයක් අරගෙන. එතකොට, තමන් තුලත් අනිත් අය තුලත් යම් කිසි දෙයක් ඇති උනහම 'අනේ මේ වගේ වෙන්න ඇත්නම් කොච්චර හොඳද' කියලා හිතනවා **- දිට්ඨිං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති -** 'මෙන්න කථා කරන මනුස්සයා' 'මෙන්න කෙලින් මනුස්සයා' 'මේ විදියටයි වෙන්න ඕන' කියලා කියනවා. සමහර වෙලාවට සම්පූර්ණ මිත්‍යා දෘෂ්ඨිය. **තං ගරුං කත්වා රාගො උප්පජ්ජති** = එහෙම හිතලා ඒකට ඇලීමක් ඇතිවෙනවා. ඒකට දෘෂ්ඨියකුත් ඇතිවෙනවා. අපි සමහර වෙලාවට ඔය බටහිර ඉන්න අයගේ යම් යම් කථාවල් ඇහුවහම ඒ ගොල්ලො කථා කරන්නේ සම්පූර්ණයෙන්ම දෘෂ්ඨි ගතවෙලා. හැබැයි කරුණු කාරණා සහිතයි. දෘෂ්ඨියේ ඉන්නේ, නමුත් දෘෂ්ඨිට පුළුවන් ප්‍රඥාවේ ඇඳුම දාගන්න. හැබැයි ප්‍රඥාව නොවෙයි. ඕක හරියට විවාහ වෙන්නා වූ දෙන්නෙක් මගුල් දවසට අඳින්නාවූ ඇඳුම වගේ. ඒක හැමදාම ඇඳගෙන ඉන්නේ නෑ. ඒ ඇඳුමට හැඩයි. ඒ වගේ මේ දෘෂ්ඨිය කියන එක ප්‍රඥාවේ ඇඳුම් ඇඳ ගන්නවා. ප්‍රඥාවේ ස්වරූපය ගන්නවා. ප්‍රඥාවේ ආකාරය ප්‍රඥාවේ හැඩය ගන්නවා. එතකොට බාහිරයට දිස් වන්නේ හොඳක් හැටියට. හැබැයි ඇත්ත තත්වය නම් අරකයි. එතකොට කෙනෙකුට හිතෙනවා 'මට මේ වගේ කෙනෙක් වෙන්න තිබෙනවා නම් හොඳයි, මෙහෙම තමයි වෙන්න ඕන, මෙන්න මනුස්සයා' කියලා නිකන් ඒකට ඇදීමක් ඒවාගේම ලෝභ කිරීමක් ගරුකිරීමක් ඇතිවෙනවා. එතකොට ඒ පස්සේ ඇතිවෙන සිතුවිලි මොනවාද? පස්සේ ඇති වෙන්නේ අර දෘෂ්ඨිය අරමුණු කරගෙන ඇති වෙන්නාවූ බැඳීම්. ඇති වෙන්නාවූ අගය කිරීම්. ඇති වෙන්නා වූ කථාවල්. චිත්ත චෛතසික ධර්මයක්. ඒක නිසා එතනදී තිබෙන්නේ දෘෂ්ඨිය අගේ කරලා ඒ පැත්තට හැරිච්ච ලෝභ සිතුවිලිවල පහළ වීමක්. ඒක තමයි **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො** කියලා කියන්නේ. මේ අවස්ථාවේදී පහළ වෙන්නාවූ සිත්වල තිබෙන වීර්ය ගතිය ඡන්ද ගතිය චිත්ත ගතිය තමයි මෙතන සහජාත ධර්ම හැටියට ඉදිරිපත් කරගන්නේ. (මෙතැනදී අකුසල ධර්ම අතර ප්‍රඥාව වැඩ කරන්නේ නෑ)

ඊළඟට අපි 6 වෙනි විසර්ජනා වාරය ඉදිරිපත් කර ගනිමු.

**6. අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. සහජාතාධිපති – අකුසලාධිපති චිත්තසමුට්ඨානානං රූපානං අධිපතිපච්චයෙන පච්චයො** = අකුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අධිපති වෙනවා ප්‍රධාන වෙනවා. මොකක්ද මේ අව්‍යකෘතය? මෙතැනදී අව්‍යාකෘත වෙන්නේ විපාක සිත්, ක්‍රියා සිත්, රහතන්වහන්සේලාගේ සහ අපේ චිත්ත වීථිවල වැඩ කරන ක්‍රියා සිත්. ඊළඟට රූප ධර්ම සහ නිර්වාණය. නමුත් නිර්වාණය අකුසල ධර්මයන්ට අරමුණු වෙන එකක් නොවෙයි. කුසල ධර්මවලත් උපරිම කුසල ධර්මයන්ට තමයි නිර්වාණය අරමුණු වෙන්නේ. එතකොට මෙතැන අකුසල ධර්මයෝ අව්‍යාකෘත ධර්මයන්ට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන තැන සහජාත ප්‍රත්‍යයෙන් තමයි ප්‍රත්‍යය වෙන්නේ ආරම්මණ ප්‍රත්‍යයෙන් නොවෙයි.

අකුසල ධර්ම අතර තිබෙනවා සිත 12ක්. ඒ අකුසල සිත්වල වැඩ කරන්නාවූ චෛතසික ධර්ම තිබෙනවා 27 ක්. ඒ 27 ඔක්කොම වෙන්නේ නෑ. ඒකෙන් ටිකක් අයින් වෙනවා. එතකොට අධිපති ශක්තිය බලපාන චිත්ත ධර්මය තිබෙනවා වීර්ය චෛතසිකය සහ ඡන්දය තිබෙනවා. ඒවා අනිත් ඒවාට බලපෑමක් කරනවා. ඒවාගේම තමයි රූප ධර්ම පහළ වෙනවා. ඒවත් අව්‍යාකෘත ධර්ම සමූහයට තමයි ගැනෙන්නේ, සහජාත ධර්ම හැටියට කථා කරන තැන.

අපි හිතමු මෙහෙම. මේ වේලාවේ අපිට මොකක් හරි තරහක් ඇති වෙනවා. එහෙම නැත්නම් ලෝභයක් ඇතිවෙනවා. අපි හිතමු ලෝභයක් කියලා. ඒ ලෝභය ඇතිවෙන කොට අපි තුල අපේ ශරීරයේ පහළ වෙනවා ඒ සිතට සරිලන සිතට ගැලපෙන සිතත් එක්කම යම්කිසි රූප ආකාර විශේෂයක්. ඒවා හඳුන්වනවා **චිත්තජ රූප** කියලා. සිතෙන් හට ගත්ත රූප කියලා. හැබැයි සිතෙන් හටගත්ත රූප උනාට ඒවා කුසලවත් අකුසලවත් නොවෙයි. ඒවා අව්‍යාකෘත ධර්ම හැටියට තමයි මේ ධර්ම විග්‍රහයේ සැලකෙන්නේ. එතකොට මේ අව්‍යාකෘත ධර්ම හැටියට සැලකෙන මේ රූප ගොනුව පහළ වෙන්න ඉදිරිපත් උනේ අන්න

අර කියපු අකුසල ධර්ම. ඒක නිසා අකුසලො **ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියලා කියන්නේ.

දැන් ඊළඟ වාරය

**7. අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො. සහජාතාධිපති – අකුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො.**

මෙතනදී වෙන්නේ දැනට පහළ වෙලා තිබෙන අකුසල ධර්මයක් එහෙම නැත්නම් පහළ වෙලා ගියාවූ අකුසල ධර්මයක් අකුසල ධර්මයකටත් අව්‍යාකෘත ධර්මයකටත් යන දෙකටම සහජාත ධර්මය හැටියට ඉදිරිපත්වෙලා ප්‍රත්‍යය වෙනවා. ඉස්සරවෙලා කිව්වේ තනිකර අරගෙන අව්‍යාකෘත ධර්ම වලට වෙනම. දැන් අකුසල ධර්මයක් අකුසලටයි අව්‍යාකෘතයටයි දෙකටම සම්බන්ධ කරලා කියනවා, එක වෙලාවට අපේ හිතේ පවතින්නාවූ නාම ධර්ම සමුදායටත් චිත්ත චෛතසික ධර්මයන්ටත් ඒ එක්කම හටගන්නා වූ රූප ධර්මයන්ටත් දෙකටම බලපාන ආකාරය තමයි මේ චිත්ත වීථි වාරයෙන් කියලා දෙන්නේ.

මෙහෙම විග්‍රයක් කරනවා - **අකුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො -** අකුසලාධිපති කියලා කියන්නේ අධිපති ධර්ම තුනෙන් 'ඡන්දයයි' 'වීරියයි' 'චිත්තයයි' යන මේ තුන්දෙනා තමයි අකුසලාධිපති. මේ තුන්දෙනා යම්කිසි අවස්ථාවකදී අකුසලයක් හැටියට යම් කිසි හිතක පහළ වෙනකොට අනිත් චෛතසික ධර්ම වලට සහජාත අධිපති වශයෙන් පහළ වෙනවා වගේම ඒ වේලාවේම පහළ වෙන්නාවූ චිත්තජ රූපයන්ටත් ඒක ඉදිරිපත් වෙනවා අධිපති ප්‍රත්‍යය බලපාල.

අපිට මේ වෙලාවේ යම් කිසි තරහක් ඇතිවෙනවා නම් ශරීරයට යම් කිසි දන ගතියක් ගොරෝසු ගතියක් ඒවාගේම තේජෝ ගතියක් යම් කිසි අපහසු ගතියක් දැනෙනවානම් ඒ දැනෙන්නේ එතනම පහළ වෙච්ච ද්වේශ සහගත හිතක බලය නිසයි. ඒ රූප තමයි අපිට දැනේනේ. ඒ සිතෙන් හදපු තදබල ගොරෝසු ගත

රූප ස්වභාවය තමයි  අපිට දැනෙන්නේ. ඒවා හැදුවේ අර දවේශ සහගත හිතක බලය නිසා. ඒ රූප චිත්තජ රූපයි. ඒ රූප අව්‍යාකෘතයි. ඒවාගේම තමයි ඒ වෙලාවේම  ඒ හිතේ අකුසල ඡන්දය අකුසල චිත්තය ඒවගේම අකුසල වීර්ය අධිපති වෙනවා. මේ දෙක සිද්ධ වෙන ආකාරය තමයි මේ මතු කරලා දෙන්නේ.

**8. අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති, සහජාතාධිපති. ආරම්මණාධිපති – අරහා ඵලං ගරුං කත්වා පච්චවෙක්ඛති, නිබ්බානං ගරුං කත්වා පච්චවෙක්ඛති. නිබ්බානං ඵලස්ස අධිපතිපච්චයෙන පච්චයො. සහජාතාධිපති – විපාකාබ්‍යාකතකිරියාබ්‍යාකතාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො.**

දැන් මෙතැනදී අව්‍යාකෘත ධර්ම කියලා කියන්නේ ක්‍රියා සිත්, විපාක සිත්, රූප සහ නිර්වාණය. අව්‍යාකෘත ධර්මයක් ඒවගේම තවත් අව්‍යාකෘත ධර්මයකට ආරම්මණ අධිපති භාවයෙන් සහ  සහජාත අධිපති භාවයෙන් ඉදිරිපත් වෙලා ඒකට බලේ දානවා. ඒවාගේම ඒකට ප්‍රත්‍යය ශක්තියෙන් ඉදිරිපත්වෙනවා උපකාර වෙනවා. මෙතැන දෙකක් කිව්වා. අව්‍යාකෘතය ආරම්මණයත් වෙනවා අව්‍යාකෘතය සහජාතත් වෙනවා.  අපි ඉස්සෙල්ලා මේකේ එකක් අරගමු.

කොහොමද අව්‍යාකෘත  ධර්මයක් තවත් අව්‍යාකෘතයකට  ආරම්මණ ස්වභාවයෙන් අධිපති වෙන්නේ කියලා.  සසර දුකෙන් මිදිලා සම්පූර්ණයෙන්ම චතුරාර්ය සත්‍යය ධර්මයන්  අවබෝධ කරගෙන රහත් මාර්ග ඵල ලබාගත්ත උත්තමයෙක් නම් ඒ රහත් මාර්ග ඵල ලබා ගත්තාවූ උත්තමයාට පහළ වෙන්නා වූ අනිත් සිතුවිලි ඔක්කොම ටික ක්‍රියා සිතුවිලි.  අපිට වගේම රහතන්වහන්සේලාටත් සිත් පහළ වෙනවා. හැබැයි වෙනස රහතන්වහන්සේලාගේ ඒ පහළ වෙන සිත් වල කුසල ශක්තිය නිෂ්පාදනය කිරීමේ අභිසංස්කරණ ශක්තිය නෑ. අකුසල නිෂ්පාදනය කිරීමේ අභිසංස්කරණ ශක්තිය නෑ. ඒක නිසා කුසල වෙන්නෙත් නෑ අකුසල වෙන්නෙත් නෑ. රහතන්වහන්සේලා දානේ දුන්නාට පින් සිද්ධ වෙන්නේ නෑ. දානමය පින්කම් වලින් ඉදිරිපත්වෙලා ක්‍රියාත්මක වෙනවා විතරයි. ඊළගට

කොච්චර භාවනා කලත් උන්වහන්සේලාට කුසල් වැඩෙන්නේ නෑ. මොන ධ්‍යානයට ගියත් මොන සමාපත්තියේ හිටියත් උන්වහන්සේලාගේ හිත්වල කුසල් වැඩ කරන්නේ නෑ. කොච්චර මනුස්සයෙකුට තරවටු කරලා අවවාදයක් කලත් උන්වහන්සේලාට අකුසල් සිද්ධ වෙන්නේ නෑ. හැබැයි ඒ වැඩේට ඒ කථාවට ඒ ක්‍රියාවට ඉදිපත් වෙන චිත්ත චෛතසික ගොන්නක් තිබෙනවා. ඒවා ක්‍රියා සිත්. දැන් රහතන්වහන්සේ නමක් රූපයක් ගැන හිතනවා කියලා හිතමු. ගහක් ගැන හිතනවා. ඒ ගහ කියලා කියන්නේ කුසලයක් නොවෙයි. ඒ ගහ කියලා කියන්නේ අකුසලේකුත් නොවෙයි. ඒ ගහ කියලා කියන්නේ කුසල අකුසල ශක්තීන්ගෙන් අයින් වෙච්ච එක්තරා විදියක අව්‍යාකෘත ධර්ම ස්වභාවයක්. රහතන්වහන්සේ නමක් ගහක් ගැන මෙනෙහි කරනකොට ඒ වෙලාවේ ඒ රහතන්වහන්සේට පහළ වෙන්නේ ක්‍රියා සිත්. එතකොට අරමුණු කරන්නේ අව්‍යාකෘතයක්. අව්‍යාකෘතයක් අව්‍යාකෘතයකට බලපාන විදියයි මේ කියන්නේ ආරම්මණ වශයෙන්.

තවත් අපි මේ විදියට ඉහළට ගිහිල්ලා ගමු. රහතන්වහන්සේ නමක් තමන් වහන්සේට ලැබිච්ච ඵලය ‘මම මේ විදියට අහවල් අවස්ථාවේදී නිවන් සැප වින්ද. මට මෙහෙම ඵලයක් ලැබුණා කියලා ඒ අරහත් ඵලය පිළිබඳව අරමුණු කරනවා. ඒ අරහත් ඵලය අරමුණු කරන කොට රහතන් වහන්සේට පහළ වෙන ඒ සිතුවිලි සහ චෛතසික ක්‍රියා සිත්. එතකොට ක්‍රියා සිතක් කියන අව්‍යාකෘත සිතකින් අර ඵල සිත අරමුණු කරනවා. එතකොට අව්‍යාකෘතයක් අව්‍යාකෘතයක් අරමුණු කරනවා.

ඊළඟට නිර්වාණය. නිර්වාණ ධාතුව ඇවිල්ලා කුසලයක් නොවෙයි. මෙතැන මෙහෙම එකක් තිබෙනවා. ඔය සමහර තැන් වල සූත්‍ර දේශනා වල කුසල ධර්ම කියලා කියන තැන නිර්වාණය ගැනත් අමතන තැන් තිබෙනවා. ඒකෙන් කියන්නේ නිර්වාණය හොයා යන මාර්ග වශයෙන්. ඒකෙන් කියවෙන්නේ නිර්වාණයම කුසල් කියන එක නොවෙයි. ඒක ආරම්මණයක් වශයෙන් කුසල ධර්මයක් කියන එකයි. හැබැයි නිර්වාණයට පින් රැස්කිරීමක් අකුසල් කිරීමක් නෑ. ඒක අව්‍යාකෘත ධර්ම ස්වභාවයක්. එකක් තිබෙනවා **කිං කුසලගවෙසී** කියලා. ඒක නිසා එතන පටලවා ගන්න හොඳ නෑ. දැන් මේ නිර්වාණය අරමුණු කරනකොට රහතන්වහන්සේට ඒ නිර්වාණය අරමුණු කරන හිත්

වලින් කවදාකවත් පින්සිදු වෙන්නේ නෑ. එතකොට ඒ අරමුණු කරන්නේ අව්‍යාකෘතයක්. අව්‍යාකෘතය අරමුණු කරගෙන පහළ වෙන්නේ අව්‍යාකෘත වූ ක්‍රියා සිත්. ඔන්න ඔය විදියට **ක්‍රියා සිත්** තිබෙනවා **ඵල සිත්** අරමුණු කරන. ඒවත් එක්ක චෛතසික ධර්මයෝ පහළ වෙනවා. ආන්න ඒ විදියට තමයි අව්‍යාකෘතයක් අව්‍යාකෘතයකට බලපාන විදිය අපි තේරුම් ගන්නේ. ඒ ආරම්මණ වශයෙන්.

ඊළඟට සහජාත වශයෙන් ගත්තොත් කුසලයක් නිසා ධර්මතා 4 එනවා. අකුසලයට යන්නේ ඡන්ද චිත්ත විරිය විතරයි. අකුසල ධර්ම පැත්තේ වැඩ කරන්නේ මේ ධර්මතා විතරයි. ප්‍රඥාව අකුසලයක් නොවෙයි. ප්‍රඥාව කුසලයක්. එතකොට රහතන්වහන්සේලාගේ හිත්වල පහළ වෙන්නාවූ ඒ ක්‍රියා සිත්වල පහළ වෙනවා ඡන්ද චිත්ත විරිය විමංසා කියලා ඒ ධර්ම 4. ඒවත් එක්ක ඒ වේලාවේම පහළ වෙන අනිත් චෛතසික ධර්මයන්ට ඒ හතර දෙනාම අධිපතිවෙලා, බලවත් වෙලා leadership එකක් අරගෙන ඒ හතර දෙනාට අනුයාත වෙලා කටයුතු කරන්න ඒවා හදාගන්නවා. ආන්න ඒකට කියනවා **සහජාත අධිපති භාවය** කියලා.

ඒකෙ වාර කීපයකුත් සඳහන් කරලා තිබෙනවා. ඒ තමයි **අරහා ඵලං ගරුං කත්වා පච්චවෙක්ඛති** = රහතන් වහන්සේලා තමන් වහන්සේලා විඳපු අරහත් ඵලය ගරු කරලා සලකන වෙලාවේ හිතන වෙලාවේ මෙනෙහි කරන වෙලාවේ මනසිකාරය පවත්වන වෙලාවේ ආරම්මණ වශයෙන් ඒක පහළ වෙනවා. ආරම්මණ වශයෙන් ප්‍රත්‍යය උප්පන්න ධර්ම පහළ වෙනවා. අර අරමුණ ගරු ස්වභාවයට පත්වෙලා අධිපති වෙනවා.

**අරහා නිබ්බානං ගරුං කත්වා පච්චවෙක්ඛති. නිබ්බානං ඵලස්ස අධිපතිපච්චයෙන පච්චයො** = රහතන්වහන්සේලා නිර්වාණය උතුම්කොට සලකලා ගරුකරලා මෙනෙහි කරනවා. එතකොට උන්වහන්සේලාට පහළ වෙන්නෙත් ඔය ක්‍රියා සිත්. ආරම්මණ වශයෙන් ගරු භාවයට පත්වෙන්නේ නිර්වාණය. ඵල සිත් වලටත් එහෙමයි. ඊළඟට නිර්වාණයටත් එහෙමයි.

අපිටත් පහළ වෙනවා සමහර වෙලාවට යම් යම් ක්‍රියා සිත්. ඒවා රහතන්වහන්සේලාට වගේ එකක් නොවෙයි හසිතුප්පාදය හැර අනිත් අහේතුක සිත්වල තිබෙන ක්‍රියා සිත් දෙක.

ඊළඟට තිබෙනවා **සහජාතාධිපති – විපාකාබ්‍යාකතකිරියාබ්‍යාකතාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො** = සහජාත භාවය කියනකොට ඒ වෙලාවේම විපාක හරි ක්‍රියා හරි සිතක් පහළ වෙනකොට ඒත් එක්කම පහළ වෙන්නාවූ රූප ධර්මයන්ට සහ චෛතසික ධර්මයන්ට එතන පහළ වෙන්නාවූ ධර්මතා 4 ඡන්ද චිත්ත විරිය විමංසා යන ධර්මතා 4 ඉදිරිපත් වෙලා අධිපති භාවයට පත්වෙනවා. මේක තමයි අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට ක්‍රියාත්මක වෙන විදිය. දැන් **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන 8 වෙනි වීථිය ඔය විදයට තේරුම් ගන්න ඕන.

**9. අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති – සෙක්ඛා ඵලං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති, නිබ්බානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති. නිබ්බානං ගොත්‍රභුස්ස, වොදානස්ස, මග්ගස්ස අධිපතිපච්චයෙන පච්චයො.**

මේ වීථිය ටිකක් අමුතුයි. මේ කියන්නේ අව්‍යාකෘත ධර්මයන්ට අරමුණු වෙනවා කුසල ධර්මයක්. ඒක මේ විදියට හිතමු. රහතන්වහන්සේලාට පහළ වෙන්නේ ක්‍රියා සිත්. අනිත් අවශේෂ රහත් නොවිච්ච උත්තමයෝ එනම් සෝවාන් සකෘදාගාමී අනාගාමී යන උත්තමයෝ නිවන් අරමුණු කරනවා. නිවන් අරමුණු කරනකොට පහළ වෙනවා ඵල සිත්. ඵල සිත් කියලා කියන්නේ නිර්වාණය අරමුණු කරගෙන ක්‍රියාත්මක වෙන සිත්. සෝවාන් ඵල සිත, සකෘදාගාමී ඵල සිත, අනාගාමී ඵල සිත යන මාර්ග සිත් වලට ප්‍රත්‍යය වෙනවා උපකාර වෙනවා නිර්වාණය අරමුණුවීම් වශයෙන්. ඒකෙ විග්‍රය අපිට සලකලා දෙනවා මෙහෙම **- සෙක්ඛා ඵලං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** = යම් කිසි කෙනෙක් සෝවාන් භාවයට පත් උනහම සකෘදාගාමී අනාගාමී තත්වයට පත් උනහම මාර්ග සිත්

වලින් නිර්වාණය අරමුණු කළා. ඵල සිත් වලින් නිර්වාණය රස වින්දා. ඊට පස්සේ නිර්වාණය රස වින්ද ඒ ඵල සිත අගේ කරලා හොඳයි කියලා ඊළඟට පස්සේ සාමාන්‍ය සිත් වලින් මෙනෙහි කරනවා. දැන් ඵල සිතෙන්ම ඵල සිතක් මෙනෙහි කරන්න බෑ. ඵල සිතෙන් කරන්නේ නිර්වාණය පැත්තට හැරිච්ච අව්‍යාකෘත ධර්මයක් අරමුණු කරන එක. ඵල සිත අරමුණු කරන්න පුළුවන් කම තිබෙන්නේ පස්සේ පහළ වෙන කාමාවචර භාවය තිබෙන කුසල් සිත් වලට. ප්‍රත්‍යවේක්ෂා කරන ඒ කාමාවචර කුසල් සිත අතෙන් පුළුවන් ඵල සිත අරමුණු කරන්න. **සෙක්ඛා ඵලං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** යනුවෙන් කියන මේ වෙලාවේදී වර්තමානයේ පහළ වෙන්නා වූ සිත්වලට ප්‍රත්‍යය වෙනවා, ඵල සිත ආරම්මණික ධර්මයක් හැටියට. කුසල ධර්මය තමයි ප්‍රත්‍යය ලබන්නේ. අව්‍යාකෘත ධර්මය තමයි ‘ඵල සිත’.

ඊළඟට තිබෙනවා **සෙක්ඛා නිබ්බානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති** = නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරනකොට නිර්වාණයෙහි ශාන්ත ගතිය හිතන කොට - අපි හිතමු සෝවාන් ඵල සිත උපදවා ගත්ත කෙනෙක් නිර්වාණය ගැන දේශනා කරනවා නම් හෝ මෙනෙහි කරනවා නම් ඒ වෙලාවට පහළ වෙන්නේ නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර සිත්. නමුත් නිවන් අරමුණු වෙන්නේ නෑ කාමාවචර සිත් වලට. ඵල සිත් වලට පමණයි නිවණ අරමුණු වෙන්නේ. නමුත් ධර්ම ස්වභාවය මෙහෙමයි කියලා මෙනෙහි කරන කොට, ප්‍රත්‍යයවේක්ෂා සිත් පහළ වෙන්නේ. එතකොට සිද්ධ වෙන්නේ **අව්‍යාකෘත ධර්මයක් කුසල ධර්මයකට** හේතු වෙන එකයි. තව තිබෙනවා ‘නිර්වාණය’ ‘ගෝත්‍ර භූ සිත’ ‘මාර්ග සිත’ යන මේවත් අරමුණු කරනකොට අධිපති සභාවයෙන් ඒ ධර්ම ආරම්මණ වශයෙන් වැඩ කරනවා = **නිබ්බානං ගොත්‍රභුස්ස, වොදානස්ස, මග්ගස්ස අධිපතිපච්චයෙන පච්චයො.**

**10.** **අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති – චක්ඛුං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති. සොතං... ඝානං... ජිව්හං... කායං... රූපෙ... සද්දෙ... ගන්ධෙ... රසෙ... ඵොට්ඨබ්බෙ... වත්ථුං... විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති**

අව්‍යාකෘත ධර්මයක් අකුසල ධර්මයකට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් ඉදිරිපත් වෙනවා. මෙතැන් තිබෙන්නේ ආරම්මණාධිපති විතරයි. මේ කාරණයේදී අකුසල ධර්මයකට (අකුසල සිත් 12) හේතු වෙනවා අව්‍යාකෘත ධර්මයක්. අපි රූප ගැන කථා කළා. ලෞකික වශයෙන් තිබෙන රූප සියල්ලම අව්‍යාකෘතයි. සමහර ඒවා තිබෙනවා ඉන්ද්‍රිය ගෝචර රූප. ඒවාගේම සමහර රූප තිබෙනවා මනසට හසුකරගත යුතු. ඒවා ඉන්ද්‍රිය ගෝචර වෙන්නේ නෑ. අපි හිතමු අපි තරහෙන් යම් කිසි රූප ස්වභාවයක් අරමුණු කරන කොට ඇගේ රස්නයක් ඇතිවෙනවා කියලා. ඇගේ රස්නයක් ඇති උනහම ඒක අපිට හරි පීඩාවක්. ඒ පීඩනය ගැන අපිට තරහ යනවා මොකද්ද මේ කියලා. එහෙම නැත්නම් සීතලක් හැදෙනවා. සීතල ගැන හරි අමනාපයක් අසන්තෝසයක් ඇති වෙනවා. අසන්තෝසය කියලා කියන්නේ අකුසල ධර්ම. හැබැයි ඒකට අරමුණ හැටියට ඉදිරිපත් වුනේ අර 'සීතල'. ඒක අව්‍යාකෘතයක්. 'රස්නය' අව්‍යාකෘතයක්. ඔය වගේ 'රූපයෝම' - අකුසල ධර්මයන්ට - ඒවාගේම ලෝභ සිත් පහළ වෙන්න - ඒවගේම ද්වේශ සිත් පහළ වෙන්න උදව් වෙනවා.

ඒවාගේම තවත් අපි හිතුවොත් කොහොමද අකුසල ධර්ම ලෝභයට ගනන් ගන්නේ කියලා හොඳ ලස්සන දෙයක්, හොඳ රූපයක්, ලස්සන දෙයක් කිව්වහම ඒක 'ආරම්මණයක්' ඒක හිත නොවෙයි. අපි රූපයමය අරමුණක් ගෙන ඒක රස විඳිනවා. රූපමය ආරම්මණයක් කියලා කියන්නේ අව්‍යාකෘතයක්. ඒක රස විඳිනවා කියලා කියන්නේ තවත් හිතකින් ලෝභ කරනවා. ලෝභ කරන වෙලාවට පහළ වෙන්නේ අකුසල ධර්ම. ඒ අකුසල ධර්මයන්ට අරමුණ වශයෙන් ඉදිරිපත් වෙන්නේ අව්‍යාකෘත ධර්මයක්. මේ විග්‍රහය මේ විදියට අපිට තේරුම් ගන්න පුළුවන්.

**චක්ඛුං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.** = තමාතුළ තිබෙන්නා වූ රූපමය ධර්මයක් අරමුණු කිරීම් වශයෙන් පහළ වෙන විදිය. පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ මෙතැන තිබෙන්නේ **චක්ඛුං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති** කියන තැන චක්ඛු කියලා කියන්නේ අර ඉස්සෙලා කියපු විදියේ රූපයක් අරමුණු කිරීම වශයෙන්

වගේ නොවෙයි. මේක අව්‍යාකෘතයක් තමයි හැබැයි මේක 'විපාක රූපමය අව්‍යාකෘතයක්'. චක්ෂුව කියලා කියන්නේ ඇහැ කියලා කියන්නේ විපාක හැටියට පහළ වෙච්ච අව්‍යාකෘතයක්. මේ විපාක අව්‍යාකෘතයක් වූ ඇහැ 'අනේ මගේ ඇහැ, අනේ මගේ කන, අනේ මගේ ශරීරය, අනේ මගේ දිව, අනේ මගේ නාසය කියලා මේවා හොඳට සංසන්දනය කොට බැලීම් වශයෙන් හෝ ආත්ම දෘෂ්ඨියට දාල බැලීම් වශයෙන් හෝ ඒකට ආස්වදානීය වශයෙන් ඇලිලා බැඳිලා යනවා. ඒ ඇලී බැඳී පහළවෙන සියලුම සිත් අකුසල් සිත්. හැබැයි ඒ අකුසල් සිත්වලට අරමුණු වෙන දේවල් සියල්ලක්ම අව්‍යාකෘතයි. ගෝචර රූපත් අව්‍යාකෘතයි. මලක් සද්දයක් ගන්ධයක් රසයක් යන ඔක්කොම අව්‍යාකෘතයි. ඒවා අරමුණු කරන්නා වූ ද්වාර වශයෙන් තිබෙන්නා වූ දොරටු ප්‍රසාදයෝ අව්‍යාකෘතයි. ඒක නිසා අව්‍යාකෘත ධර්මයක් අකුසල ධර්මයකට ආරම්මණ අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙන ආකාරය මේ විදියට තේරුම් ගන්න ඕන. **අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. ආරම්මණාධිපති -** අරමුණු වීම් වශයෙන්.

අද දවසේ මම මෙන්න මේ කරුණුටික කියලා දුන්නා. වීථි 6 කිව්වා. අධිපති ප්‍රත්‍යය යටතේ වාර තිබෙනවා 10 ක්. ගිය සතියේ අපි හතරක් කිව්වා.

ඒ තමයි 1) කුසල ධර්මයක් කුසල ධර්මයකට 2) කුසල ධර්මයක් අකුසල ධර්මයකට 3) කුසල ධර්මයක් අව්‍යාකෘතයකට 4). කුසල ධර්මයක් කුසල ධර්මයකට සහ අව්‍යාකෘතයකට යන දෙකටම කොහොමද ප්‍රත්‍යය ශක්තිය යොදන්නේ කියලා.

අද කථා කළේ වීථි 6 යි. ඒ වීථි හය

5) අකුසල ධර්මයක් අකුසල ධර්මයකට අධිපති වෙන විදිය 6) අකුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අධිපති වෙන විදිය 7) අකුසල ධර්මයක් අකුසල සහ අව්‍යාකෘත දෙහෙකටම ප්‍රත්‍යය වෙන විදිය 8) අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘතයකට අධිපති වෙන විදිය 9) අව්‍යාකෘතයක් කුසලයකට අධිපති වෙන විදිය සහ 10) අව්‍යාකෘත ධර්මයක් අකුසලයකට අධිපති වෙන විදිය.

මේ තමයි මේ විසර්ජනා වාර 10 යන පිළිවෙල. අපිට භාවනාවක් හැටියට උනත් පට්ඨානයේ මේ ගොනුව හොඳට හිතන්න පුළුවන්. තමන්ගේම ඇඟ ගැන හිතනකොට 'ඒක හොඳයි' කියලා ගන්නකොට පහළවෙන ඒ හිතේ තිබෙන්නේ මොකක්ද අරමුණ? අරමුණ අව්‍යාකෘතයක්. සිත අකුසල ධර්මයක්. ඊළඟට කුසල හැටියටත් ඕක මෙනෙහි කරන්න පුළුවන්, ඒ තමයි විදර්ශනා කරන්නත් පුළුවන්. විදර්ශනා කරනවා ඇඟ අනිත්‍යයයි. ඇඟේ තිබෙන්නාවූ ස්වභාවය මෙහෙමයි කියලා මෙනෙහි කරනකොට එතනදී පහළ වෙන්නේ අව්‍යාකෘත ධර්මයක් හරහා කුසල ධර්ම. ඔය විදියට අපිට ළඟ තිබෙන්නාවූ දේ ගැට ගහලා ගැට ගහලා මනසිකාරය තුලින් බැලීමේ හැකියාව තිබෙනවා.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ විශාල ඥානයකින් විශාල ප්‍රඥාවකින්, ඒ විශාලත්වය කියලා කියන්නේ සූක්ෂම වෙච්ච බොහෝම සියුම් විනිවිද විනිවිද යන්නාවූ සිතකින් ඥානයකින් ප්‍රඥාවකින් මේ ධර්ම එක එකක් පාසා හොඳට හසුරුවලා බැලුවා, දැක්කා. උන්වහන්සේට හොඳට තේරුණා, වැටහුණා. ඒවාගේම උන්වහන්සේගේ ළඟම හිටපු ශ්‍රාවක ස්වාමීන්වහන්සේ සැරියුත්මහරහතන්වහන්සේගේ වැඩේම ඔය ධර්මයන්ගේ තිබෙන්නාවූ සියුම් තත්වයන් පරික්ෂා කරලා බැලීම. උන්වහසේට හොඳට පේනවා. අපිට අද කථා කරන්න තිබෙන්නේ උන්වහසේලාගේ ඒ ඥානයෙන් සිතින් දැකපු දැනගෙන සටහන් තියපු ඒවා. ඒ නිසා මේ ධර්මය තේරුම් ගැනීමට ඒවාගේම අපිට අහන්න සාකච්ඡා කරන්න අවස්ථාව සැලසුණා. පෙර පිනක්. කුසලයක්. කර්ම විපාකයක්. මේ ධර්ම මාර්ගය සාකච්ඡා වශයෙන් මෙනෙහි කිරීම් වශයෙන් ඇසීම් වශයෙන් හිතීම් වශයෙන් හිත පවත්වාගෙන ගොස් අපි සැම දෙනාටම මේ ධර්මත් අවබෝධ කරගෙන සංසාර දුකෙන් මිදිලා නිවනින් සැනසෙන්න ලැබේවා! මේ ධර්මය ඇසීම හිතීම මනසිකාරය ඒ සඳහා ප්‍රතිපදාවක් වේවා! අපි සැම දෙනාටම නිර්වාණ ධාතුව ඉතා ඉකමනින් අවබෝධ වේවා! කියලා මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු! අප්‍රමාණ පින් ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නයක් </u>- **නිබ්බානං ගොත්‍රභුස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන තැනේදී ඇත්තටම ගෝත්‍ර භූ කියලා කියන්නේ සෝවාන් මාර්ග චිත්ත වීථියේ පහළ වෙන අවසාන කාමාවචර සිත හැටියටයි දැනගෙන ඉන්නේ. එතකොට මෙතැනදී කාමාවචර සිතකින් නිර්වාණය අරමුණු කරනවද කියන එක ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර </u>- ගෝත්‍ර භූ කියන සිත සමහර අය කාමාවචර කියලා කියන්න පුළුවන්. හැබැයි මේක නිර්වාණය සලකුණු කරන හිත. මාර්ග සිත තමයි ඉස්සෙල්ලාම නිර්වාණය දකින හිත කියලා කියන්නේ. මාර්ග සිතට නිර්වාණය මෙන්න මේකයි කියලා ලකුණක් තබන හිත තමයි ගෝත්‍ර භූ හිත කියලා කියන්නේ. ඒක නිසා මේක full කාමාවචර හිතකුත් නොවෙයි. **නිබ්බානං ගොත්‍රභුස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන තැන තිබෙන්නේ නිර්වාණ ධාතුව ගෝත්‍ර භූ කියන මාර්ග සිතට කලින් සිතට ආරම්මණ ස්වභාවයක් ඇති කරලා දෙනවා. ඒක මාර්ග සිතේම ගැව්ලාවගේ තිබෙන සිතක්. ඇත්ත වශයෙන්ම නිර්වාණය කාමාවචර සිත් වලින් අරමුණු කරන්නේ නෑ. ඉස්සෙල්ලා නිර්වාණය අවබෝධ කරගත්ත කෙනෙක් ඵල සමාපත්තියට සමවැදිලා නිර්වාණය අරමුණු කරමින් හිටපු වෙලාවක වෙච්ච දෙයක් පස්සේ මෙනෙහි කරන්න පුළුවන් කාමාවචර සිතකින්. හැබැයි ගෝත්‍ර භූ හිත නිර්වාණය ඉස්සෙල්ලාම සටහන් කරන සිත. හැබැයි නිර්වාණය දකින එකක් නොවෙයි. කෙලෙස් නසන එහෙකුත් නොවෙයි. මේක හරිම සියුම් තැනක්. කාමාවචර සිත්වලින් කාමාවචර දේවල්ම අරමුණු කරනවා. අනිත්‍ය දුක්ඛ අනාත්ම මෙනෙහි කිරීමත් කාමාවචර සිත් වලින් කරන්නේ. ඒ කියන්නේ අනිත්‍යය ධර්මය කියන එක සංඛත ධර්මයක තිබෙන හැඩක්. දුක්ඛ ස්වභාවය කියලා කියන්නෙත් සංඛත ධර්මයන්ගේ තිබෙන යම් කිසි ආකාරයක්. අනාත්ම කියන්නෙත් සංඛත ධර්මයක් තිබෙන ආකාරයක්. එතකොට ඒ ආකාර ඔක්කොම දකින්නේ බලන්නේ කාමාවචර සිත් වලින්මයි. ඒක කවදාකවත්ම ලෝකෝත්තර සිතකින්, නිර්වාණය අරමුණු කරන සිතකින් කරන්න බෑ. ගෝත්‍ර භූ සිත ඔය වැඩේ කරන්නේ නෑ. ගෝත්‍ර භූ සිතින් කවදාකවත්ම සංස්කාරයක අනිත්‍යය බලන්නේ නෑ. දුක බලන්නෙත් නෑ. මේක තිබෙන්නේ නිර්වාණය පැත්තට හැරිලා. සමහර වෙලාවට කියනවා උපරිමය කියලා නමුත් මේක ලෝකෝත්තර නොවන්නා වූ ලෝකෝත්තර සිතක්. ඒ විදියටයි මේක තේරුම් ගන්න තිබෙන්නේ.

බොහොම පින් ස්වාමීන්වහන්ස ඒ කියන්නේ මාර්ග චිත්ත වීථියේදී අපි ගත්තොත් ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිතක් තමයි මුලින්ම පරිකර්ම උපචාර අනුලෝම විදියට ක්‍රියාත්මක උනේ. එකෙන් තමයි අනිත්‍ය හෝ දුක්ඛ හෝ අනාත්ම හෝ ප්‍රකට වෙමින් පවතින්නේ. ඊට පස්සේ ගෝත්‍ර භූ සිතින් නිවන පැත්තටම හැරෙන ගතියක් තිබෙනවා.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව්, ගෝත්‍ර භූ සිත තමයි ඉස්සෙල්ලාම නිවනේ ගැටෙන්නේ. ඊට පස්සේ නිවන සලකනු කරලා දීලා ගෝත්‍ර භූ සිතට බෑ කෙලෙස් නසන්ට, නිවනේ රස විදින්නට. මෙන්න මෙහෙම එකක් මෙතන තිබෙනවා කියන එක විතරක් මාර්ග සිතට උලුප්පලා දෙනවා. එච්චරයි.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස **විපාකාබ්‍යාකතකිරියාබ්‍යාකතාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො** කියන කොට එතැනදී ඕනෑම විපාකද, කොහොමද ස්වාමීන්වහන්ස ගන්නේ? දැන් ක්‍රියා කියනකොට අහේතුක ක්‍රියා සිතද නැත්නම් එතන කොයි විදියටද එන්නේ කියන එක තව පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - විපාකාබ්‍යාකතා කියන්නේ උදාහරණයක් හැටියට භවාංගය ගැන හිතන්න. **විපාකාබ්‍යාකතකිරියාබ්‍යාකතාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො** කියන තැන කෙනෙකුට පටලැවෙන්න පුළුවන් ආරම්මණයට. මේක සහජාතයි. සහජාතයි කියලා කියන්නේ, අපි හිතමු අපිට නින්ද ගිය වෙලාවට පහළ වෙන භවාංග සිත් වල විපාක ස්වභාවයක් තිබෙනවා. භවාංග සිත් ස්වභාවයෙන්ම විපාකයි. ඒ විපාක සිත්වල සහ ක්‍රියා සිත් වල පහළ වෙන්නා වූ චිත්ත චෛතසික ගොන්නක් තිබෙනවා. ඒකට අයිති වෙනවා හසිත උත්පාදය සහ අනිත් ක්‍රියා අයිති වෙනවා. නමුත් ඒ සිත් ගොන්නේ එනම් ක්‍රියාවෙත් විපාකයේත් තිබෙන්නාවූ චෛතසික ගොන්නේ ඡන්ද චිත්ත විරිය විමංසා කියලා තිබෙන

චෛතසික ධර්ම වලින් යම් කිසි ධර්මයක් (මේ හතරම එන්නේ නෑ ) එකක් හෝ එතැන තිබෙනවා නම් අනිත් ධර්මයන්ට සහජාත වෙනවා. අපි නිදාගත්ත වෙලාවට අපේ ඇඟේ පහළ වෙනවා ඒ භවාංග සිතට ස්වරූපයෙන් යුක්ත වෙච්ච අමුතුම විදියේ දුර්වල රූප ස්වභාවයක්. ඒවත් විපාක සිතට සරිලන විදියකට තමයි පහළ වෙන්නේ. ඒවත් සහජාත ධර්ම.

තව එකක් තිබෙනවා පටලවා ගන්න හොඳ නෑ. විපාක අබ්‍යාකතය කියලා කිව්වහම චක්ඛු විඤ්ඤාණය විපාකයි. සෝත, ඝාණ, ජිව්හා, කාය විඤ්ඤාණත් විපාකයි. ඒකේදී කෙනෙකුට තේරුම් ගන්න පුළුවන් මෙහෙම. එතනදී ඇයි ඒවා සලකන්නේ නැත්තේ කියලා වැඩිපුර. බලන්න මෙහෙම. එතන තිබෙන්නේ කරුණු ටිකයි. ඵස්ස වේදනා සංඥා චේතනා ඒකාග්‍රතා ජීවිතේන්ද්‍රිය මනසිකාරය. එතකොට එතැන තිබෙනවද ඡන්දය? නෑ. එතන තිබෙනවද වීර්ය? නෑ. එතන තිබෙනවද විමංසාව. නෑ. එතකොට කෙනෙකුට හිතෙන්නේ පුළුවන් ඒක එහෙමනම් සහජාත වැඩේ කරන්නේ නැති එකක්ද කියලා. එතැන් සිත තිබෙනවා. චිත්තාධිපති භාවය එතැන තිබෙනවා. අනිත් අවස්ථාවලදී අපි හිතමු අහේතුක ගොඩේ තිබෙන ක්‍රියා සිත තුන. ඒවාට ගිහිල්ල බැලුවහම යම් කිසි තැනක ඡන්දය තිබෙනවා නම් අනිවාර්යෙන් හිත තිබෙනවාමයිනේ. යම් කිසි හිතක වීර්ය තිබෙනවා නම් යම් කිසි සිතක විමංසාව තිබෙනවා නම් එතනදී අධිපති ස්වභාවය ක්‍රියාත්මක වෙනවා. හතරම ඕනේ නෑ. එකක් හරි දෙකක් හරි තුනක් හරි ඇත්ද එතනදී විපාකයට සහජාත ස්වභාවයෙන් ඉදිරිපත් වෙනවා. ක්‍රියා සිත් වලට සහජාත භාවයෙන් ඉදිරිපත් වෙනවා. ඒවාගේම රූප ධර්මයන්ට සහජාත භාවයෙන් ඉදිරිපත් වෙනවා. ඒ විදියටයි ඕක ගලපන්න ඕන වෙන්නේ.

තෙරුවන් සරණයි, ස්වාමීන්වහන්ස එතෙන්දි විශේෂයෙන්ම අධිපති කියන නිසා තමයි මතක් උනේ. සාමාන්‍ය ඵල චිත්තය ගත්තොත් ඒවා විපාක අබ්‍යාකත වෙනවා ඒ වගේම රහතන්වහන්සේගේ ක්‍රියා සිත් ක්‍රියා අබ්‍යාකත වෙනවා.

<u>ස්වාමීන්වහන්සේ</u> - අනිවාර්යයෙන්ම වෙනවා. එතන උන්වහන්සේලාට විපාකත් තිබෙනවා. ක්‍රියාත් තිබෙනවා.

<u>ප්‍රශ්නයක්</u> - අවසරයි ස්වාමීන්වහන්ස අර කලින් ප්‍රශ්නයේදී සහජාත භාවයෙන් ආවට අධිපති භාවය හැම වෙලේම එන්නේ නෑ වගේ තමයි තේරුනේ. ඒකෙදි සමහර සිත් වලට සහජාත වශයෙන් ඉදිරිපත් උනත් අධිපති භාවය එන්න පුළුවන්ද කියන ප්‍රශ්නය එනවා. සාමාන්‍යයෙන් වීර්‍යයකුත් නෑ, අකුසල ධර්ම කුසල ධර්ම වලට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙන. එහෙම එකක් නැත්තේ ඇයි?

<u>පිළිතුර</u> - ඒක දක්වලා නම් නෑ. නමුත් අපි මෙහෙම හිතුවොත් ප්‍රශ්නය නිරාකරණය වෙයි කියලා මම හිතනවා. අපි හිතමු අපි සතෙක් මරනවා. මට තරහක් ආව ඊට පස්සේ ඒ තරහට මස් කන්න හරි මොකක් හරි එහෙකට ඒ සතා මැරුවා. ඒක සම්පූර්ණයෙන්ම අකුසල්. එතකොට ඒ අකුසලය ගැන පස්සේ 'මම මරපු එක හොඳයි කියලා' අකුසල් හිතකින් නම් සතුටු වෙන්න පුළුවන්. ඒක ගරු කරන්න පුළුවන්. හැබැයි එතැනදී ඒ අකුසල සිතෙන්ම අර ඉසෙල්ලා කරපු සත්ව ඝාතනය ටිකක් අගය කරලා වැඩි කරලා ගරු කරලා හිතන ගතිය තිබෙනවා. හැබැයි කුසල සිතකින් නම් 'මේ මම කරපු දේ හොඳයි. මේක කුසලයක්' කියලා හිතන්න බෑ. කුසල සිතකින් ගරු කරලා අකුසලයක් ගන්න බෑ. ඒක නිසා අපිට පැහැදිලිව තේරෙනවා අකුසල් සිත ගරුකරන කුසල් සිත පහළ වෙන්නේ නැති නිසා අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො කියලා එකක් නෑ. හැබැයි ඔහොම කියන කොට මෙහෙම හිතෙන්න පුළුවන් 'එහෙමනම් අකුසල ධර්මයක් එනම් අපි කරපු පාපී දෙයක් අපි විදර්ශනා කරනවා, අනිත්‍යයයි දුක්ඛයි අනාත්මයි කියලා. එතකොට ආරම්මණ භාවය තිබෙනවා. හැබැයි විදර්ශනා කරන කොට 'මේක හොඳටම අල්ල ගන්න ඕන' 'මේක අනිත්‍යම අනිත්‍යයයි' කියලා එහෙම සලකන්නේ නෑ. ඒක නිසා අකුසල ධර්මයක් කුසල ධර්මයකට ගරු වෙන්නේ නැත්තේ ආන්න ඒක නිසයි. අකුසල ධර්මයකට නම් අකුසල ධර්මයක් ගරු වෙනවා.

එතකොට ස්වාමීන්වහන්ස ගෝත්‍ර භූ සිත ගැන ධ්‍යාන වලට කලිනුත් අපි කථා කරනවා. එතකොට එතැන ගෝත්‍ර භූ හිතයි මාර්ග හිත් වලට කලින් තිබෙන ගෝත්‍ර භූ හිතයි කියලා දෙකක් තිබෙනවා. එතකොට ස්වාමීන්වහන්ස මෙතැන සඳහන් වෙන්නේ මොන ගෝත්‍ර භූ හිතාද කියලා තේරුම් ගන්නේ කොහොමද? මේ දෙකේ වෙනසක් තිබෙනවා නේද ස්වාමීන්වහන්ස?

පිළිතුර - ඔබ එහෙම වෙනසක් තිබෙනවා. ප්‍රථම ධ්‍යානයට පත් වෙන්නා වූ කෙනාට තිබෙනවා ඉසේල්ලාම සාමකාමී වූ කාමාවචර කුසල් සිත් වලින් තමයි ධ්‍යාන ආරම්මණයක් හසුරුවන්නේ. මෛත්‍රීය හෝ වේවා අනාපාන සතිය හෝ වේවා මොකක් හරි එකක් කුසල් සිතකින් තමයි එයා ඕක හසුරුවන්නේ. ඒ කියන්නේ කමාවචරයි. කාමාවචර කුසල් සිත උනාට ඒ කුසල් සිතේ ධ්‍යානයට කිට්ටු කරන කොට නීවරණ නෑ. ඊට පස්සේ තමයි ඇතිවෙන්නේ කාමාවචර සිත් ලයින් එක නැති කරලා හොඳම හොඳ රූපාවචරයක් හසුරුවන්න ආරම්මණය ලබාදෙනවා. ඒ යන වීථියේ පරිකර්ම කියලා කියන්නේ කාමාවචර. උපචාර කියලා කියන්නෙත් කාමාවචර. හැබැයි කිට්ටුයි ධ්‍යානයට. අනුලෝම කියලා කියන්නෙත් අරමුණ අරමුණු කරන හොඳම හොඳ කාමාවචර සිතක්. නමුත් ගෝත්‍ර භූ කියන තැනේදී තව දුරටත් කාමාවචර වෙන්නේ නෑ. එයා එතනින් ඊළඟට මහග්ගත භාවයට පත්කරන තැන සලකුණු කරලා දෙන්නාවූ සිත තමයි ගෝත්‍ර භූ සිත. ඒක ලොකොත්තර නොවෙයි. ඒක ධ්‍යානයකට සම්බන්ධ කරලා ගත්තට පස්සේ ඊට කලින් තිබ්ච්ච තත්වයෙන් මිදිලා ඔන්න ධ්‍යානය එනවා කියලා ධ්‍යානයේ තත්වය සටහන් ගහල දෙන්නා වූ එක තමයි එතනදී ගෝත්‍ර භූ කියලා කියන්නේ.

එතකොට ස්වාමීන්වහන්ස අර වීථී වල කථා කළානේ ගෝත්‍ර භූ හිත ගරු කරලා සලකනවා කියලා. එතකොට මේ දෙකම ගරු කරලා සලකන එකද කියන්නේ? නැත්නම් මාර්ග සිතට කලින් තිබෙන ගෝත්‍ර භූ සිතද ගරු කරලා සලකන්නේ කියන එකද කියන්නේ?

ස්වාමීන්වහන්ස - මෙතැන මහත්තයා ගෝත්‍ර භූ හිත කියලා කියන්නේ නිර්වාණය සලකන එක. නිවන් පැත්තට ගිය හිතයි.

බොහොම පින් ස්වාමීන්වහන්ස හොඳට තේරුණා. එතකොට ස්වාමීන්වහන්ස සෝවාන් වෙලා කියල කියන කියන සමහර අයට මේ ගෝත්‍ර භූ සිත කියලා කියන එක මොකක්ද කියලවත් දන්නේ නැති තත්වයක් දැන් තිබෙන්නේ. අපිට

කවදාහරි මේක විසඳා ගන්න නම් අපිට කවද හරි මාර්ග ඵල ලැබුනොත් ගෝත්‍ර භූ කියන එක අපිට සිහි කරගන්න හරි ආවර්ජනය කරලා දැන ගන්න හැකියාවක් තිබිය යුතුමද ස්වාමීන්වහන්ස?

<u>ස්වාමීන්වහන්සේ</u> - නියම ධර්මය දැක්කොත් ඒ පාරේ යනවා. මම අහල තිබෙන හැටියට මෙන්න මෙහෙම එකක් වෙනවා මෙහෙ. ඕක නිවනට විතරක් නොවෙයි මහත්මයා අනිත් ඒවගෙත් ඕක වෙනවා. සමහර අය මේ රටවල් වලට එනවා. මේ රටවල් වලට ඇවිල්ලා රස්සාවල් ගන්නවා. දොස්තරවරුත් ඉන්නවා කියලා ආරංචියි. nurse ලත් ඉන්නවා. ඒ වාගේම සමහර එක එක අය රස්සාවල් කරන්න ඇවිල්ලා ඉන්නවා. ඒ ගොල්ලෝ බැලුවයින් පස්සේ නම්වශයෙන් ගත්තට පස්සේ සමහරු දොස්තරලා සමහරු nurse ලා සමහරු engineers ල. ඒ ගොල්ලෝ කියනවා අපි මේ විදියට ඉගෙන ගත්තා කියලා. මම interview කරලා එහෙම නොවෙයි. මමත් කට්ටිය කියන ඒවගෙන් දැන ගත්තේ. හැබැයි ඒ ගොල්ලන්ට යම්කිසි වැඩක් බාර දුන්නට පස්සේ දැන් දොස්තර කෙනෙක් නම් ලෙඩෙක් බාර දෙනවා. engineer කෙනෙකුට නම් වැඩක් බාර දෙනවා කරන්න කියලා. nurse කෙනෙක් නම් වැඩක් බාර දෙනවා කරන්න කියලා. එහෙම දුන්නයින් පස්සේ ඒ ගොල්ලෝ කරන වැඩෙන් තේරෙනවලු ඒ ගොල්ලෝ මොන ඉස්කෝලෙටද ගියේ කියලා. ඊට පස්සේ මේ ගොල්ලන්ගේ certificate හොයනවලු. පස්සේ බලනකොටලු තේරෙන්නේ මේ ගොල්ලෝ හොර සහතික ගහගෙන ආපු කට්ටිය කියලා. මට ඕක ගොඩක් අය කියලා තිබෙනවා. ඉන්දියාවේත් එහෙමලු. මේ ගොල්ලෝ ගුරුවරු දන්නෙත් නැතිලු, වැඩේ දන්නෙත් නැතිලු, හැබැයි ඒ ගොල්ලෝ හරියට කියනවා ඒ ගැන. නමුත් වැඩේ කරන්න ගියාට පස්සේ බෑ. හේතුව ඒ ගොල්ලෝ skip වෙලා ඇවිල්ලා තිබෙන්නේ. දැන් යම්කිසි කෙනෙක් ඉස්කෝලේ ගිහිල්ලා O – level, A - level කරලා campus ගිහිල්ලා ඒකෙ තිබෙන්නා වූ දේවල් කරලා ඊට පස්සේ ඒ ආපු path එකේ ඉන්නකොට ඒගොල්ලෝ කරපු දේවල් ඔක්කෝම දන්නව, මතකයි. ඉගෙන ගත්තු ශාලාව ගිහිපු තැන් ගිහිපු වාහන ඒවත් මතකයි. දැන් එහෙම මතක හිටින්නේ සහ හිතේ රැදෙන්නේ ඒ path එකේ ගිය හින්දයි. එහෙම නැති එක්කෙනකුට කොහොමද එහෙම හිතෙන්නේ.

නිවනෙත් ඔය වගේ. සංස්කාරයන්ගේ අනිත්‍ය තේරෙන්නේ නැතුව සංස්කාරයන්ගේ දුක තේරෙන්නේ නැතුව සංස්කාරයන්ගේ අනාත්මය අහු වෙන්නේ නැතුව යම් කිසි කෙනෙක් චිත්ත සමාධි මාත්‍රයෙන් නිවන් ගියා කියන එක සිද්ධ වෙන්නේ නෑ. මේ අපි අහල තිබෙන ධර්මයට අනුව සිද්ධ වෙන්නේ නෑ. ඉතින් ඒවා කියන්න බැරි, ඒවා නැත්තේ ඒ පාරේ ගියේ නැති හින්දයි. ඒක තමයි තේරුම් ගන්න තිබෙන්නේත් සහ මගේ දැනුමේ හැටියට කියන්න තිබෙන්නේත්.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ පහු ගිය දේශනාවේදී සඳහන් කරන්න යෙදුනා ලෝකෝත්තර ධර්ම සහ උත්තරිමනුස්ස ධර්ම කියලා. පොඩ්ඩක් ස්වාමීන්වහන්ස ඒ ගැන පැහැදිලි කරලා දෙන්න පුලුවන්ද?

<u>පිළිතුර</u> - බුදුරජාණන්වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කරලා තිබෙනවා මෙන්න මෙහෙම ශික්ෂාපදයක්. භික්ෂූන්වහන්සේලාට ශික්ෂාපද වැඩියි. ගිහියන්ට තිබෙන්නේ පහයි පෝයට අටයි නිත්‍ය වශයෙන් සමහර විට අටක් තිබෙනවා සමහර විට දහයක් තිබෙනවා. ස්වාමීන්වහන්සේලාට හරි වැඩියි. සමහර වෙලාවට හැරෙන්නවත් බැරි තත්වයක් තිබෙන්නේ ශික්ෂාපදත් එක්ක. ඒකෙ එක ශික්ෂාපදයක් තිබෙනවා මෙන්න මෙහෙම. **'යො පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං ආරොචෙය්‍ය භූතස්මිං, පාචිත්තියන්'** කියලා. මේක record වෙනවා. අපේ හාමුදුරුවරුත් අහයි. ඇහුවොත් ප්‍රාතිමෝක්ෂය බලන්න. ඒකේ තිබෙන්නේ

**යො පන භික්ඛු** = යම් කිසි භික්ෂූන් වහන්සේ නමක්

**අනුපසම්පන්නස්ස** = උපසම්පදා වෙච්ච නැති කෙනෙකුට - සාමණේර හෝ ගිහි හෝ - කාන්තාවක් හෝ පිරිමියෙක් හෝ දෙවිකෙනෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ

**උත්තරිමනුස්සධම්මං ආරොචෙය්‍ය භූතස්මිං** = උත්තරීමනුස්ස ධර්ම ගැන කියනවා නම්. (නමුත් මේ කියන්නේ නැති දෙයක් නොවෙයි. තමන්ට තිබෙන දෙයක් කියන්නේ).

**පාචිත්තියන්** = නමුත් වරදක් වෙනවා. පචිති ආපත්තියක් වෙනවා.

ඒ තරම්ම බුදුරජාණන්වහන්සේ උත්තරිමනුස්සධර්ම ගැන තැන් තැන් වල කියා පාන්න එපා කියලා තහනම් කරලා තිබෙන්නේ. ඒක අනුපසම්පන්නයෙකුට කිව්වට පස්සේ අපිට වරදක් වෙනවා, පචිති ආපත්තිය කියලා. එහෙම වෙන්නේ ඇත්තටම තමන්ට තිබෙන උත්තරිමනුස්සධර්මයක් ගැන කිව්වොත්. නැති එකක් කිව්වොත් මහණකම ගහලා යනවා. ඒ කියන්නේ පාරාජිකා වෙනවා. ඒ හාමුදුරුවන්ගේ සිවුර විතරක් තිබෙනවා ඇතුලේ මොකක්වත් නෑ. ඒ දැනුවත්ව කිව්වොත්, තමන්ට එහෙම නෑ නමුත් එහෙම තිබෙනවා කියලා කිව්වොත් පරාජිකා වෙනවා. ඒකෙන් කියන්නේ නැතුව කියන්න හොඳත් නෑ ඇතුව කියන්න හොඳත් නෑ, අනුපසම්පන්නයන්ට. එතකොට මෙතැන තිබෙනවා උත්තරිමනුස්සධම්ම කියලා වචනයක්. උත්තරිමනුස්සධම්ම කියලා කියන්නේ එක ජාතියක් ලෝකෝත්තර ධර්ම කියලා කියන්නේ තව ජාතියක්. හැබැයි ලෝකෝත්තර ධර්ම කියලා කියන ධර්ම ටික උත්තරිමනුස්සධම්ම යටතේත් තිබෙනවා. ලෝකෝත්තර ධර්ම කියලා ගත්තොත් එහෙම සෝවාන් මාර්ග ඵල කියන්නේ ලෝකෝත්තර ධර්ම - සකෘදාගාමී මාර්ග ඵල කියන්නේ ලෝකෝත්තර ධර්ම - අනාගාමී මාර්ග ඵල ලෝකෝත්තර ධර්ම - අරිහත් මාර්ග ඵල ලෝකෝත්තර ධර්ම. ලෝකය සමබන්ධ නැති ලෝකය අරමුණු කරන්නේ නැති ලෝකයේ කිසිම දේකට සම්බන්ධයක් නැති කෙලින්ම ලෝකයේ එහා පැත්තම අරමුණු කරන ලෝකයේ එහා පැත්තේ තිබෙන දේවල්ම ජේන දේවල් තමයි ඔය ධර්මතා 8 සහ නිවන. එක නිසා මේවට කියනවා **නව ලොවතුරා ධර්මය** කියලා.

උත්තරිමනුස්ස ධර්ම කියලා කියන්නේ මාර්ග ඵල ධර්ම 8 + ප්‍රථම ධ්‍යානය + ද්විතීය ධ්‍යානය + තෘතීය ධ්‍යානය + චතුර් ධ්‍යානය + ආකාසඤ්ඤායතනය + විඤ්ඤාණඤ්චඤ්ඤායතනය + ආකිඤ්චඤ්ඤායත + නේවසඤ්ඤා නාසඤ්ඤායතනය + ඉර්ධි බල යන මේවා සාමාන්‍ය මිනුස්සුනට නැති ඒවා. සාමාන්‍ය මිනුස්සුන්ට ධ්‍යාන නෑ. ඒක නිසා මේවා සමාන්‍ය මිනිස් ජීවිතිය ඉක්මවා ගියාවූ ධර්ම ටිකක්. ඒක නිසා උත්තරිමනුස්සයි. මනුස්ස ධර්ම ඉහළට ගිය එකක්. ඕකෙන් කියන්න යන්න හොඳ නෑ මනුස්සධර්ම උතුරා ගිය මනුස්ස ධර්මයක් කියලා. මේවාට උත්තරිමනුස්සධම්ම කියලා කියන්නේ මනුස්සධර්ම වලට වඩා ඉහළ ගිය ධර්ම වලට කියනවා උත්තරිමනුස්සධම්ම කියලා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ මෙතැන දේශනා කරන්නේ ලෝකෝත්තර ධර්ම කියන්න එපා කියලා නොවෙයි. ඒවා සම්පූර්ණයෙන්ම කියන්න හොඳ නෑ. මට

ප්‍රථම ධ්‍යානයවත් තියෙනවා කියලවත් කියන්න එපා කියලා. මට ප්‍රථම ධ්‍යානය තිබෙනවා දෙවෙනි එක තිබෙනවා තුන්වෙනි එක තිබෙනවා හතරවෙනි එක තිබෙනවා අපි ඔක්කොටම එහෙම තිබෙනවා කියලා එහෙමවත් කියන්න එපා කියලා. අනිත් එක තමයි සාමාන්‍ය මිනුස්සු ගමේ ඉන්නේ. කියන්න එපා කියලා කියනවා 'මම නම් ගමේ ඉන්න කැමති නෑ, මම නම් සම්පූර්ණයෙන්ම අරණ්‍යවාසී' කියලා කැලේට කැමතියි කියලවත් කියන්න එපා කියල කියනවා. ඒ උත්තරිමනුස්ස ධර්ම ඇතුලේ ලෝකෝත්තර ධර්මත් තිබෙනවා. ඔය තමයි ඔකේ වෙනස මහත්මයා. මම හිතනවා මේක තේරෙන්න ඇති කියලා.

ඔව් ස්වාමීන්වහන්ස හොඳට තේරුණා. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නයක්</u> - **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො. සහජාතාධිපති** කියන තැනදී ගන්නේ ලෝභ මූල සිත් වලත් ද්වේශ මූල සිත දෙකත් කියලා හිතෙනවා. හැබැයි මොහ මූල සිත් දෙකත් ඒවාගේම චෛතසික වශයෙන් ගන්න කොට විචිකිච්ඡාව හැර කියල ගන්න ගතියක් තිබෙනවා. ඒ ඇයි කියලා පොඩ්ඩක් පැහැදිලි කර ගන්න අවශ්‍යයි ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - එතන විචිකිච්ඡාව හැර කියල ගන්නේ ඇයි කියලා හිතුවොත් විචිකිච්ඡාව තිබෙන හිතක ස්වභාවය කුමක්ද? සාමාන්‍යයෙන් අකුසල ධර්ම කියනකොට අපි 12 කියලා ගන්නවා නමුත් ක්‍රියාත්මක වීම වශයෙන් ගන්නකොට හැකියාව තිබෙන ධර්ම විතරයි සලකන්නේ. විචිකිච්ඡාව තිබෙන හිතේ ස්වභාවය තමයි අරමුණක් හයියට අහුවෙන්නේ නෑ. ඒකයි ඒ. විචිකිච්ඡාව තිබෙනවානම් ඒකෙ ආයේ අල්ලන්න විදියක් නෑ.

එහෙමයි ස්වාමීන්වහන්ස එතන්දී ඡන්දය දෙන්නෙත් නෑ. එතන විරියයි චිත්තයයි විතරයි නේද යෙදෙන්නේ ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> **-** ඔව් මහත්තයා, ඒක කියනකොට තේරුම් ගන්න ඕනෑ හැමවෙලාවේම තිබෙනවා ආරම්මණය ගරුකරලා අනිත් චෛතසික ටිකත් එක්ක ඔක්කොම ඇදගෙන යන එක තමයි අධිපති ස්වභාවය කියලා කියන්නේ. අනිත් චෛතසික ටිකයි හිතයි ඔක්කොම ඇදගෙන යන ගතිය තිබෙන්නාවූ තැන තමයි අධිපති භාවය තිබෙන්නේ. ඒක තිබෙන්නේ මෙහෙමයි. මෙන්න මෙහෙම මම පොඩි වාක්‍යයක් කියන්නම් ඕකට. ඕක තිබෙන්නේ මෙහෙමයි. අර තුන්වෙනි අධිපති ප්‍රත්‍යය ගැන කියනකොට මෙන්න මෙහෙම වාක්‍යක් තිබෙනවා. ඒක හොඳට හිතේ තියා ගන්න.

**ඡන්දාධිපති වීරියාධිපති චිත්තාධිපති වීමංසාධිපති** කියලා

**යං යං ධම්මං ගරුං කත්වා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අධිපතිපච්චයෙන පච්චයො.** = 'යම් කිසි යම් කිසි ධර්මයක් ගරු කරීම් වශයෙන් යම්යම් ධර්මයක් පහළ වෙත්ද (චිත්ත චෛතසික ධර්ම) ඒ ඒ ධර්මයෝ තමයි ඒ ඒ ධර්මයන්ට අධිපත වෙන්නේ' කියන එක මතක තියා ගත්තම හරි පහසුයි ඔය වැඩේ ගොඩ දාගන්න.

එහෙමයි ස්වාමීන්වහන්ස බොහොම පින්. විචිකිච්ඡා සහගත හිත්වලින් අරමුණක් ගරුකොට ගන්නේ නැති ගතිය අනිවාර්යෙන්ම පැහැදිලි වෙන නිසා ඒක ඒ විදියට තේරුම් ගන්න පුළුවන්. තෙරුවන් සරණයි!

අප්‍රමාණ පින් ස්වාමීන්වහන්ස අදත් මේ වගේ කාලයක් මිඩංගු කරලා අපේ ධර්මඥාණය වැඩි කරලා නිවන් මාර්ගයට තව තවත් අපිව අවතීරණය වෙනවා මේ වගේ සාකච්ඡාවලට සම්බන්ධ වීමෙන්. යමක් අපිට හිතන්න ධම්ම විචයට සම්බන්ධ කරගන්න අවස්ථාව ලැබෙනවා. ඒවගේම මග පැහැදිලි වෙනවා. ස්වාමීන්වහන්ස සවනට සිසිලස වෙනුවෙන් ඔබ වහන්සේට මම පුණ්‍යානුමෝදනා කර සිටිනවා අද කරන ලද ධර්ම දානය වෙනුවෙන්. ඔබ වහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමු වෙනවා අද දවසේ දේශනය සහ සාකච්ඡාව නිමා කරන්න. ලබන සතියේ හමුවෙන බලපොරොත්තුවෙන් සමුගන්නවා.

<u>ස්වාමීන්වහන්සේ</u> - සැමදෙනාටම තෙරුවන් සරණයි! අදත් අපේ පින්වතුන් එකතුවෙලා මේ skype මාධ්‍ය ඔස්සේ පැවැත්වෙන ධර්ම සාකච්ඡාව සිද්ධ කළා.

අපි මේ බොහෝම ගැඹුරු ධර්ම පරාසයක ඉන්නේ. මේ පිනවතුන් හරි ටික දෙනෙක් මේකට යොමු උනා කියන එකත් ඇත්ත වශයෙන්ම අහන්න සන්තෝසයි. අනිත් එක තමයි මේවායේ ක්‍රියා කාරී ස්වභාවය අපි සලකුණු කිරීම් වශයෙන් කෙටියෙන් කිව්වට මෙකේ තිබෙන විස්තරය හරි ගැඹුරුයි. හොඳට බැලුවයින් පස්සේ තව විග්‍රය තිබෙනවා. අද අපේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා ඒවාගේම ජයන්ත මහත්මයා ඉදිරිපත්වෙලා සියලු දෙනාම එකකාසු කරගෙන මේ ධර්ම සාකච්ඡාවට සහ සම්බන්ධ උනා. මෙයින් ජනිත කරගත්තාවූ සියලු කුසල ධර්මයන්ගේ බලයෙන් පුණ්‍ය ධර්මයන්ගේ බලයෙන් ශක්තියෙන් සැමදෙනාටම ධර්මාවබෝධය සිද්ධ වේවා! ධර්ම මනසිකාරය පවත්වා ගන්න ලැබේවා! ඒවාගේම ධම්ම විචය සම්බොජ්ඣංගය වැඩේවා! ශ්‍රද්ධාව වීර්ය සති සමාධි ප්‍රඥා ගුණ ධර්මයන්ගෙන් ධර්මය අරමුණු කරගන්න ලැබේවා! සැම දෙනාගේම සන්තාන තුල සමථ භාවනාව විපස්සනා භාවනාවල් වඩාගෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම ධර්ම සර්වප්‍රකාරයෙන්ම අවබෝධ කරගෙන සංසාර දුකෙන් මිදිලා අමා මහා නිවනෙන් සැනසෙන්ට ලැබේවා! නිවන් පිණිස මේ කුසල ධර්මයන් පුණ්‍ය ධර්මයන් හේතු වසනා වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි! අපේ පිනවත් ලලිත් දළුවත්ත මහතාට නිදුක් නිරෝගි භාවය සැලසේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රර්ථනා කරනවා. තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.